# බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ
# දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරට
# බඳවා ගැනීමේ පරිපාටිය

01 සම්බන්ධ වන ආයතන

| | | | |
|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව | - | - |
| 1.2 | අමාත්‍යාංශය - බස්නාහිර පළාත් ප්‍රවාහන, මාර්ග හා ග්‍රාම සංවර්ධන | යොමු අංකය: 1/7/5/01 | දිනය :2019.01.03 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම | යොමු අංකය :DMS/WP/03/10 | දිනය :2018.04.27 |
| 1.4 | ප්‍රධාන ලේකම් (බ.ප) ගේ නිර්දේශය | යොමු අංකය: CSWP/PTR/96/FI/1 | දිනය: 2019/01/28 |
| 1.5 | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය : | දිනය: |
| 1.6 | බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය: WPC/PSC/MNP/01/4/180 | දිනය: 2019.03.18. |
| 1.7 | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය | යොමු අංකය: | දිනය: |

02 2.1 පත්කිරීම් බලධාරියා - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2.2 ක්‍රියාත්මක වන දිනය - ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

03 සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය - අධීක්ෂණ

3.2 ශ්‍රේණි - විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය

අනුමත තනතුරු සංඛ්‍යාවට සීමා වන පරිදි අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රියාවලියක් මගින් බඳවා ගනු ලබන, ජ්‍යෙෂ්ඨ විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක/ සුසාධ්‍යකාරක/උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරට විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලනමය/ පිරිස් කළමනාකරණ කාර්යයන් පැවරෙන නිලධර ගණයකි.

3.4 කාර්යයන් පැවරීම - ග්‍රාම සංවර්ධන සමිති වලට අදාල වන්නා වූ පනත් හා ප්‍රඥප්ති වලින් පවරා ඇති රාජකාරි හා සංවර්ධන කටයුතු අධීක්ෂණය කිරීම හා ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය කිරීම

04 තනතුරේ ස්වභාවය - ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

05 වැටුප්

5.1 වැටුප් කේත අංකය - රා.ප.ච. 03/2016 අනුව MN 7-2016

5.2 වැටුප් පරිමාණය - රු: 41580 - 11x 755 - 18x 1030- 68425/-

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/A.DM/4/7/292
දිනය : 2019/04/01

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර MN 7-2016 වැටුප් කේතයට අනුව

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| MN - 4 වැටුප් කේතය යටතේ වැටුප් ලබන නිලධාරින්ට. | **05** | 44,600/- |
| MN - 5 වැටුප් කේතය යටතේ වැටුප් ලබන නිලධාරින්ට පෞද්ගලිකව වන සේ. | **06** | 45,355/- |

සටහන : - බඳවාගැනීම් /උසස් කිරීම්වල දී නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල වැටුප් පරිමාණය සඳහන් කිරීමේ දී අංක 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපලේඛන I හි සඳහන් නියමිත වැටුප් පරිමාණය සඳහන් කළ යුතුය. එහෙත් ගෙවීම් සිදුකළ යුත්තේ උපලේඛන II හි සඳහන් පරිදි විය යුතු බැවින් ඒ බැව් ද එම පත්වීම් ලිපිවල සඳහන් කළ යුතුය.

06

සේවා ගණයට අයත් තනතුර /තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි | විශේෂ | 03 | ග්‍රාම සංවර්ධන සමිති කටයුතු පිළිබඳ මෙම පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ නියෝජිතයා ලෙස කටයුතු කිරිම. |
| | | | දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන හා කාන්තාභිවර්ධන කටයුතු මැනවින් ක්‍රියාත්මක වන බවට වග බලා ගැනීම. |
| | | | දිස්ත්‍රික්කයේ ග්‍රාම සංවර්ධන නිලධාරින්ගෙන් මෙම පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය විසින් නියම කර ඇති වාර්තා ලිපි ලේඛන තොරතුරු හා සංඛ්‍යා දත්ත කලට වේලාවට ලැබීමට සැලැස්වීම හා ඒ පිළිබඳව අවශ්‍ය සහතික කිරිම. |
| | | | දිස්ත්‍රික්කයේ ග්‍රාම සංවර්ධන නිලධාරින්ගේ හා මැහුම් උපදේශිකාවන්ගේ අධීක්ෂණ කටයුතු ඉටු කිරිම හා ඔවුන්ගේ ප්‍රායෝගික ප්‍රගතිය මැන බැලීම. |
| | | | දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන සමිති වල විගණන කටයුතු සිදු කර තිබේදැයි පරික්ෂා කිරිම හා ආරවුල් විසඳීමට අවශ්‍ය කටයුතු කිරිම. |
| | | | දිස්ත්‍රික්කය තුල මැහුම් මධ්‍යස්ථාන පරික්ෂාව හා අධික්ෂණය. |
| | | | දිස්ත්‍රික් හා ප්‍රාදේශිය සම්බන්ධීකරණ රැස්වීම් කටයුතු සම්බන්ධීකරණය |
| | | | ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බලමණ්ඩලයේ ලේකම් වශයෙන් දිස්ත්‍රික්කයේ සියලු සමිති ජාලගත කිරිම. |
| | | | ග්‍රාම සංවර්ධන සමිති හරහා දිස්ත්‍රික්කයේ ජනතාවගේ භෞතික හා මානව සම්පත් සංවර්ධනයට අදාල සැලසුම් දිස්ත්‍රික් මට්ටමින් සංවර්ධනය කිරිම. |
| | | | බස්නාහිර පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තියේ මෙම තනතුරට අදාල කර ඇති රාජකාරි ඉටුකිරිම. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/4/7/292
දිනය : 2019/04/01

07 බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| කුසලතා | 100% |
| විවෘත | අදාල නොවේ |
| සීමිත | අදාල නොවේ |

7.2 විවෘත බඳවා ගැනීම :- අදාල නොවේ

7.3 සීමිත බඳවා ගැනීම :- අදාල නොවේ

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- විශේෂ ශ්‍රේණිය

7.4.2 සුදුසුකම්

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම් :- අදාල නොවේ

7.4.2.2 වෘත්තීය සුදුසුකම් :- අදාල නොවේ

7.4.2.3 පළපුරුද්ද :- i. බස්නාහිර පළාත් ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරේ පළමු පන්තියේ නිලධාරියෙක් වීම.

ii. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 05 තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

7.4.2.4 කායික සුදුසුකම් :- i. තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.4.2.5 වෙනත් :- i. ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම.

ii. යහපත් චරිතයකින් යුක්ත වීම.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිම.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/4/7/2/92
දිනය : 2019/04/01

7.4.3 වයස

7.4.3.1 අවම සීමාව - අදාළ නොවේ.

7.4.3.2 උපරිම සීමාව - අදාළ නොවේ.

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය :

පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අයදුම්පත් ලැබී ඇති අවස්ථාවක දී හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සම ලකුණු ලබා ඇති අවස්ථාවකදී ලිඛිත විභාගය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාගන්නා අනුපිළිවල අනුව පුරප්පාඩු පිරවිය යුතුය . එසේ නොවන අවස්ථාවල දී ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිපල මත පමණක් පුරප්පාඩු පිරවිය යුතුය.

7.4.4.1 ලිඛිත විභාගය :-

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය ඇසුරෙන් | 100 | 40 |
| බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති , ආයතන සංග්‍රහය හා බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය රීති | 100 | 40 |

ලිඛිත විභාගය ඇතුලත් විෂය නිර්දේශය ඇමුණුම 1හි දැක්වේ

7.4.4.1.1 පවත්වන බලධරයා - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ඔවුන් විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

7.4.4.2 වෘත්තිය පරීක්ෂණය - අදාල නොවේ

7.4.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - -

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු - සුදුසුකම් පරීක්ෂා කිරීම

7.4.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS | ADM | 4/7/292
දිනය : 2019/04/01

7.4.4.4 වyුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| i. පශ්චාත් උපාධියක් (පහත විෂයන් සඳහා ) (සමාජවිද්‍යාව, ආර්ථික විද්‍යාව, ප්‍රජා සංවර්ධනය, ග්‍රාම සංවර්ධනය, ප්‍රදේශීය සංවර්ධනය | ලකුණු 15 | 25 | 40 |
| ii. විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ අනුමත, පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මාස 12 කට නොඅඩු (ඉහත i හි සඳහන් විෂයයන් සඳහා) පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් | 10 | | |
| iii. සේවා පලපුරුද්ද පළමුවන ශ්‍රේණියේ එක් වසරක් සඳහා ලකුණු 5යි | 50 | 75 | |
| iv. ක්‍රියාත්මක කරනු ලැබූ විශේෂ ව්‍යාපෘති වාර්තා. (එක් ව්‍යාපෘතියක් සඳහා ලකුණු 05යි) ඇමුණුම 02 අනුව | 20 | | |
| v. පෞරුෂය | 05 | | |

7.4.4.4.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මණ්ඩලය පත්කරන බලධරයා : - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ඔවුන් විසින් බලය පවරන ලද ආයතනයක් මගින්

7.4.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :- අභ්‍යන්තර අයදුම්පත් කැඳවීමේ නිවේදනයක් මගින්

08 කාර්යක්ෂමතා කඩඉම් :- අදාල නැත

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/4/T/292
දිනය : 2019/04/01

142 - U

09 භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීනතාවය |
|---|---|
| 1.රාජ්‍ය භාෂාව | අදාල නොවේ |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | අදාල වේ |
| 3.සන්ධාන භාෂාව (අදාළ වන්නේ නම් පමණි.) | අදාල නොවේ |

10 ශ්‍රේණි උසස් කිරිම :- අදාල නොවේ

11 තනතුරු වලට පත්කිරීම :- අදාල නොවේ

12 බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි වලට නොහොත් නියෝග වලටද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝග වලට ද අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු නියෝග වලට ද ආයතන ප්‍රධානීන් විසින් නිකුත් කරනු ලබන නියෝග වලට ද අනුව කටයුතු කළ යුතුය.

13 බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

14 ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :- අදාල නැත



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS / ADM / 4 / 7 / 292
දිනය : 2019 / 04 / 01

15 **අර්ථ නිරූපණ**

සතුටුදායක සේවා කාලය:

පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින් ද, සිදු කළ යුතුව තිබූ පත්වීම් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළ දී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

නිලධාරියා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා ,අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එය ද, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර 03 ක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

සක්‍රීය සේවා කාලය:

"සක්‍රීය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාලපරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

16. මෙම පරිපාටියේ විධිවිධාන සලකා නොමැති යම් කරුණක් වෙතොත් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

සකස් කළේ : ......[signature]......
( කළමනාකරණ සහකාර)
දිනය : 2019/01/08

පරීක්ෂා කළේ : ......[signature]......
(ප්‍රධාන කළමනාකරණ සහකාර)
දිනය 2019.01.08

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය 08.01.2019

අත්සන : ......[signature]......
(පරිපාලන නිලධාරි)
නම :
තනතුර :

ආර්. ජී. ඉරේෂා ශ්‍යාමලි
පරිපාලන නිලධාරි
පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස සහ ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බ.ප.)

නිලමුද්‍රාව :

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/4/7/292
දිනය : 2019/04/01

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය 2019/01/08

අත්සන : ......................................

(ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ)

නම :

අමාත්‍යාංශය :

නිලමුද්‍රාව :

එස්. ඒ. එල්. රංගනී
ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ (වැ.බ)
පළාත්, මාර්ග, ප්‍රවාහන,
සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස සහ
ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ
ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බ.ප.)
නො. 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය 2019/01/08

අත්සන : ......................................

(සහකාර ලේකම්)

නම :

අමාත්‍යාංශය :

නිලමුද්‍රාව

ආර්. එම්. ඩී. පී. කුමාර
සහකාර ලේකම්
[illegible]

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය 2014/01/08

අත්සන : ......................................

(අමාත්‍යාංශ ලේකම්)

නම :

අමාත්‍යාංශය :

නිලමුද්‍රාව :

[illegible]
ලේකම්
පළාත්, මාර්ග, ප්‍රවාහන,
සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා
ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ
[illegible]



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/4/7/292
දිනය : 2019/04/01

1 42-VIII

යොමු අංකය: CSCOP/PTR/9-6/FI/1

බස්නාහිර පළාත් මාර්ග ප්‍රවාහන හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය 2019/1/24

අත්සන : ..........
නම : ..........
ප්‍රධාන ලේකම් (බ.ප)

නිලමුද්‍රාව : ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

යොමු අංකය: WPC/MNP/01/4/180

බස්නාහිර පළාත් මාර්ග ප්‍රවාහන හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය 2019.03.18

අත්සන : ..........
නම : එම්. ජී. ඒ. තිලකරත්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

නිලමුද්‍රාව :

යොමු අංකය: GOS/ADM/4/7/292

බස්නාහිර පළාත් මාර්ග ප්‍රවාහන හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ හි දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය 2019/04/01 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි.

දිනය 2019/04/01

අත්සන : ..........
නම : ජී. සෝමසිරි
ආණ්ඩුකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම්
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලය,
10 වන මහල, ජනජය ගොඩනැගිල්ල,
අංක.628, නාවල පාර, රාජගිරිය.
නිලමුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/ADM/4/7/292
දිනය : 2019/04/01

ඇමුණුම - 01

<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ</u>

<u>දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරට</u>

**<u>කුසලතා පදනම මත බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණය.</u>**

3. විභාගයේ නම -: බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරට කුසලතා පදනම මත බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණය .

4. විභාගය පිළිබඳ විස්තර -:

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය ඇසුරෙන් | පැය 01 | 100 | 40 |
| බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහය, ආයතන සංග්‍රහය හා බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය රීති | පැය 01 | 100 | |

5. පවත්වනු ලබන බලධරයා -: බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ඔවුන් විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟින්

6. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග -: ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාව සලකා බැලීමෙන් පසුව.

7. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය | ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය ඇසුරෙන් |
| බස්නාහිර පළාත් මූල්‍ය රීති | I ,II, III , VI, V. පරිච්ඡේද පිළිබඳ දැනුම |
| බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහය හා ආයතන සංග්‍රහය | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහය හා ආයතන සංග්‍රහයේ VIII, IX, XII, XXVIII,XXXII, XXXVI පරිච්ඡේද හා ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII, XLVIII පරිච්ඡේද පිළිබඳ දැනුම. |

අත්සන : ..........................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..........................

තනතුර : ..........................

දිනය : 2019/01/08

නිලමුද්‍රාව



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/APM/4/7/292
දිනය : 2019/04/01

142-X

ඇමුණුම 02.

## විශේෂ ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කළ යුතු ආකාරය.

සමාලෝචනයට භාජනය වන උසස්වීම සඳහා ඉල්ලුම් කරන දිනට ආසන්න වසර 05 තුල

1. ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්වය උසස් කිරීමට ඉවහල් වන වැඩ සටහනක්
2. නිර්මාණාත්මක පරිසර සංරක්ෂණ වැඩ සටහනක්.

- ලකුණු ලබාදිමේදි නිර්මාණශීලිත්වය, මුල්‍යමය වටිනාකම, ප්‍රතිලාභීන් සංඛ්‍යාව, ග්‍රාම සංවර්ධන නිලධාරින්ගේ මැදිහත්විමේ ප්‍රමාණය යන අංශ සැලකිල්ලට ගනු ලැබේ.

- නිලධරියා විසින් මැදිහත්වී කරන ලද ව්‍යාපෘතිය පිළිබඳ වාර්තාවක් ප්‍රගති සමාලෝචන රැස්වීමේදි ඉදිරිපත් කළ යුතු අතර ප්‍රාදේශීය ලේකම් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ හෝ දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි ගෙන් එක් නිලධාරියෙක් විසින් එය ලිඛිතව සනාථ කරනු ලැබිය යුතුය. (සම්මුඛපරික්ෂණ මණ්ඩල නිලධාරින් ඉදිරියේ අයදුම්කරු විසින් වාචිකව ඊට අදාල තොරතුරු ඉදිරිපත් කළ යුතුය.)

අත්සන : [signature]

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :

තනතුර :

දිනය : 2019/01/08.

නිලමුද්‍රාව :

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GO3/ADM/4/1/292
දිනය : 2019/04/01